කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2022

2024 දෙසැම්බර්/ 2025 ජනවාරි

මානවශාස්ත්‍ර පීඨය

# සාහිත්‍ය විචාරය

(නව නිර්දේශය)

**පුනරුද යුගයේ අවසානයේ සිට දහඅට වන සියවස තෙක් අපරදිග සාහිත්‍ය නිර්මාණ හා විචාර අධ්‍යයනය LTCR 28214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

01. බටහිර සමාජයෙහි පුනරුදය නිර්මාණය වීම පිළිබඳ විග්‍රහයක් කරන්න.

02. දහසය වන සියවසින් පසු යුරෝපයෙහි ස්ථාපිත සමාජ දේශපාලන ආර්ථික බලවේග කෙරෙහි විශේෂාවධානයෙන් යුතුව ප්‍රංශ විප්ලවයෙහි පසුබිම සැකසුණු ආකාරය විමසන්න.

03. "වෝල්ටෙයර් සිය තීව්‍ර පරිකල්පනය මෙහෙයවා උපහාසාත්මක ශෛලියකින් යථාර්ථය නිරූපණය කළ ලේඛකයෙකි." සත්පුරුෂයා සහ අහිංසකයා කෘතිය ආශ්‍රයෙන් විමසන්න.

04. "බ්‍රිතාන්‍ය දේශපාලනය උපහාසාත්මක ව නිරූපණය කරන්නක් ලෙස "ලිලිපුට් චාරිකාව", ගලිවර්ගේ චාරිකා කෘතියෙහි ප්‍රමුඛස්ථානය හිමිකර ගනී." සනිදර්ශන ව විමර්ශනය කරන්න.

05. "ඩැනියෙල් ඩෙෆෝ විසින් රචිත රොබින්සන් ක්‍රූසෝ කෘතියෙහි කථානායකයා නිශ්චිතව ම ධනේශ්වර සමාජයීය පුරුෂාර්ථ ප්‍රතිබිම්බනය කරන ආදර්ශරූපී චරිතයකි." සනිදර්ශන ව විභාග කරන්න.

06. අභිමත මාතෘකා දෙකක් පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.
    1. ප්‍රබෝධන යුගයෙහි දාර්ශනිකයෝ
    2. දෙවන චාල්ස් රජ
    3. විග් සහ ටෝරි පාක්ෂිකයන් අතර පැවති ප්‍රතිවිරෝධතා
    4. මේරි වොල්ස්තෝන් ක්‍රාෆ්ට්

07. "තෝමස් ග්‍රේ විසින් රචිත **The Elegy Written in a Country Church -Yard,** (සුසාන කාව්‍ය) කාල දේශ ඉක්මවා සහෘද ප්‍රසාදය දිනාගත් නිර්මාණයකි." නිදර්ශනාශ්‍රයෙන් පැහැදිලි කරන්න.

08. නව සම්භාව්‍යවාදයේ ස්වර්ණමය අවධිය නියෝජනය කළ ඇලෙක්සැන්ඩර් පෝප්ගේ සංකල්ප මඟින් තත්කාලීන ලේඛන සම්ප්‍රදාය මූර්තිමත් වන අන්දම පහදන්න.

09. ගම පිළිබඳ අතීතකාමී සිතිවිලි මත පදනම් වූ ආවර්ජනාත්මක ප්‍රකාශනයක් ලෙස පාළුගම **(The Deserted Village)** කාව්‍යය රසවිඳිය හැකි දැ යි සනිදර්ශන ව පරීක්ෂා කරන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගින්)

*******************************